# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2399/38 - 2024 අගෝස්තු මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2024.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය සහ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 24අ වගන්තිය යටතේ නිවේදනය

1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 89 වන වගන්තියේ "තරුණයා" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ, ක්‍රියාත්මකව පවත්නා ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම ආරම්භ වූ වර්ෂයේ ජූනි මස පළමුවන දිනට වයස අවුරුදු දහ අටට අඩු නොවූ ද" යන වචන වෙනුවට 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 20අ(1)(අ) වගන්තිය අනුරූප වන පරිදි 2024 වර්ෂයේ ජූනි මස පළමුවන දිනට වයස අවුරුදු දහ අටට අඩු නොවූ ද (එනම් 2006 වර්ෂයේ මැයි මස 31 වැනි දින හෝ ඊට පෙර උපන්), යන වචන ආදේශ කිරීමෙන් තරුණයා යන අර්ථ නිරූපණය වෙනස් විය යුතු බවට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ හා 89 වගන්ති සහ 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 24අ වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමු.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය **ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 අගෝස්තු මස 29 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය.
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 08 - 0337

1A - G 42601— 05 (2024/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*